# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 683/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 21/04/2024<br>පැය 1400 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

නුවරඑළිය හා හැටන් පොලිස් කොට්ඨාස වලට අයත් ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.04.21 වන අද දින පෙරවරු 0900ට මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් නුවරඑළිය සිනිසිටා ක්‍රීඩාංගණයේ පිහිටි ශ්‍රවනාගාර පරිශ්‍රයේ දී පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින් 1500ක පමණ පිරිසක් සහභාගී වූ අතර කමිටු සාමාජිකයින් අමතා මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා යුක්තිය මෙහෙයුම තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා ප්‍රදේශවාසීන්ගේ සහය ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර පොලිස්පතිතුමා විසින් කමිටු සාමාජිකයින් අමතා අපරාධකරුවන් හඹා ගොස් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂිත පුහුණුවක් සහිත යතුරුපැදි 100කින් සමන්විත කණ්ඩායමක් ඉදිරියේදී  යුක්තිය මෙහෙයුමට සමගාමීව යෙදවීමට ක්‍රියා කරන බව ප්‍රකාශ කරන ලදි.

මෙහිදී ප්‍රදේශයේ අබාධිත පුද්ගලයින් 05 දෙනෙකු වෙත රෝද පුටු පරිත්‍යාග කිරීම හා පාසල් සිසුන් කිහිප දෙනෙකුට පාසල් උපකරණ බෙදා දීමක්ද සිදු කරන ලදී. මධ්‍යම පළාතට පැමිණීම වෙනුවෙන් ගරු මහජන ආරක්ෂක අමත්‍ය ටිරාන් අලස් මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා වෙත මධ්‍යම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් පතිනායක මහතා ඇතුළු උසස් පොලිස් ප්‍රධානීන් විසින් සමරු සිහිවටන  ප්‍රදානය කිරීමක් ද සිදු කෙරිණි.

මෙහිදී පැමිණ සිටි පිරිස වෙනුවෙන් සර්ව ආගමික වතාවත් ඉටු කෙරුණු  අතර මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී විය.

මෙම වැඩසටහනට අදාල ඡායාරූප කිහිපයක්










பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்
மாண்புமிகு டிரான் அலஸ்









**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**